# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 2171635 — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1539/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 03/10/2024
පැය 1310

## මාධ්‍ය නිවේදනය

**01. මුදල් හා දේපල කොල්ලකෑමක් සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කෝපායි පොලිස් ස්ථානය.**

2024.10.02 වන දින මානිප්පායි පොලිස් ස්ථානයට වාර්තා වූ විදේශීය මුදල් හා ජංගම දුරකථන දෙකක් කොල්ලකෑමේ සිද්ධියක් සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන ලදි. ඒ අනුව පොලිස් විශේෂ කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත එම අපරාධයට සම්බන්ධ සැකකරුවන් **දෙදෙනෙකු මුදල් රුපියල් 10,706,670 ක් , විදේශීය මුදල් ශී රාඝි 100 නෝට්ටු 2 ක්, තුර්කි ශී රාඝි 200 නෝට්ටු 4 ක්, යූරෝ 50 නෝට්ටු 3 ක් හා යතුරුපැදියක්** සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 20 සහ 22 යන වයස්වල පසුවන වාවකච්චේරිය සහ චුන්නාකම් ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කෝපායි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.10.02 වන දින සවස් කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ මහවත්ත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 190 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන ගල්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෘත ශරීරයක් හමුවීම - වැල්ලවත්ත පොලිස් වසම.**

2024.10.03 වන දින දහවල් කාලයේ වැල්ලවත්ත පොලිස් වසමේ මුහුදු මාවත ප්‍රදේශයේ වෙරළ තීරයට නාඳුනන පිරිමි මළ සිරුරක් ගොඩ ගසා ඇති බවට වැල්ලවත්ත පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ වයස අවුරුදු 45 ක් පමණ පෙනුමකින් යුතු පිරිමි මළ සිරුරක් වන අතර සාමාන්‍ය සිරුරකින් හෙබි උස අඩි 05 අඟල් 04ක පමණ උසකින් යුක්ත වේ. මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

වැල්ලවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**